# ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**ආරක්ෂක සේවාව 2022/2023**

**ආරප/ගි11/2022/12**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,

නො. 31, ඉසුරු මාවත,

පැලවත්ත,

බත්තරමුල්ල

# ලංසු කැඳවීමේ ආරාධනාවයි

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

**පැලවත්ත, බත්තරමුල්ල**

**සේවාවන් සැපයීම**

1. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් සේවාවන් සැපයීම වෙනුවෙන් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. **සේවාවන් සැපයීම**

| ටෙන්ඩර් අංකය | විස්තරය | ලංසු සුරක්ෂණය (රු.) |
|---|---|---|
| ආරප/ශ11/2022/23 | පිරිසිදු කිරීමේ සේවාව 2022/2023 | 150,000.00 |
| ආරප/ශ11/2022/23 | ආරක්ෂක සේවාව 2022/2023 | 125,000.00 |

3. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) මගින් සිදු කරනු ලැබේ.

4. ලංසු ඉදිරිපත් කිරීම සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසු කරුවන්ට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ගේ දුරකථන අංක 0112786396/076-0961578 මගින් අවශ්‍ය වැඩි විස්තර ලබාගත හැකි අතර 2022/10/03 දින සිට 2022/10/25 දින දක්වා කාලය තුල සතියේ රාජකාරී දිනවල පෙ.ව 9.00.සිට ප.ව 3.00.දක්වා අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල පිහිටි ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේදී ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කර බැලිය හැක. එසේ නැතිනම් ලංසු ලියවිල්ල අපගේ වෙබ් අඩවියට පිවිස නොමිලේ බාගත කරගත හැකි අතර, govanalyst.finance@gmail.com යන විද්‍යුත් තැපැල ඔස්සේ ඉල්ලීමක් කිරීම මඟින්ද එම ලියවිලි ලබාගත හැක.

5. ලිඛිත ඉල්ලුම්පතක් හා රු3,500/=ක ආපසු නොගෙවන ගාස්තුවක් ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදලින් පමණක් ගෙවීමෙන් එක් සේවාවක් සැපයීමට අදාල ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් 2022/10/03 දින සිට 2022/10/21 දින දක්වා කාලය තුල සතියේ රාජකාරී දින වල පෙ.ව 9.00.සිට ප.ව 3.00 .දක්වා ලබා ගත හැක.

6. සම්පූර්ණ කරන ලද ලංසු, ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයට 2022/10/25 දින පෙ.ව.10.00 ට හෝ ඊට පෙර වලංගු ලංසු සුරක්ෂණය සහිතව ලියාපදිංචි තැපැල් මඟින් හෝ අතින් ගෙනවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලීම මඟින් භාර දිය යුතු අතර ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ .ලංසු විවෘත කිරීම 2022/10/25 දින පෙ.ව. 10.00 ට සිදු කරනු ලබන අතර එම අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,
නො31., ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල

# කාණ්ඩ II ලංසු දත්ත සටහන් පත්‍රය

| |
|---|
| **(අ) සාමාන්‍ය** |
| සේවා ලාභියාගේ නම : |
| කොන්ත්‍රාත්තුවේ නම : |
| මූල්‍යකරණ මූලාශ්‍රය : **ශ්‍රී ලංකා රජය මඟින්** |
| **(ආ) ලංසු ලියකියවිලිවල අන්තර්ගතය** |
| ලංසු ලියකියවිලි සම්බන්ධ පැහැදිලි කරගැනීම් පහත ලිපිනයට යොමු කරන්න.<br><br>**ප්‍රධාන ගණකාධිකාරී,**<br>**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,**<br>**නො.31, ඉසුරු මාවත,**<br>**පැලවත්ත, බත්තරමුල්ල.**<br>දු.ක. : **011-2786396**<br>ෆැක්ස් : **011-2786396** |
| **(ඇ) ලංසු පිළියෙල කිරීම** |
| ලංසුකරු විසින් ඇමුණුම Iහි සඳහන් ලියවිලි ඉදිරිපත් කල යුතුය. ඇමුණුම Iහි සඳහන් එක් ලියවිල්ලක් හෝ අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ. |
| ලංසු මිලගණන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කළ යුතුය. |
| සේවාවේ වලංගු කාලය වසර 1කි. |
| එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැකි වනුයේ එක් ලංසු පතක් පමණි. කුමන හෝ ආකාරයකින් ලංසු පත් එකකට වඩා ඉදිරිපත් කොට තිබේ නම් එසේ ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු අවලංගු කිරීමට යටත් වේ. කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරනු ලබන මිල ගණන්, ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට දින **63**ක් දක්වා වලංගු විය යුතුය.<br><br>ලංසු අයදුම්පත සමඟ රු.**125,000/=** ක් වටිනාකම ඇති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති දේශීය වාණිජ බැංකුවකින් හෝ රක්ෂණ ආයතනයකින් ලබා ගත් ආණ්ඩුවේ රස පරීක්ෂක නමට ලියන ලද ලංසු බැදුම්කරයක් **2023/02/05** දක්වා වලංගු වන සේ ඉදිරිපත් කළ යුතුය.නැතහොත් ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත ඉහත වටිනාකමට මුදල් තැන්පත් කොට ලබා ගත් පොදු 172 ලදු පතෙහි මුල් පිටපත ඒ සඳහා ඉදිරිපත් කළ හැක.පහත සඳහන් අවස්ථාවල දී ඔබගේ ලංසු ඇපකරය රාජසන්තක වනු ඇත.<br><br>I. ලංසු වලංගු කාල සීමාව තුලදි ලංසුව ඉවත්කර ගන්නා බව දැනුම් දුන් විට<br>II. ලංසු ප්‍රදානය ලැබූ ලංසු කරු විසින් ආයතනය විසින් දැනුම් දුන් දිනට කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් නොකල විට |
| **(ඇ) ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීම** |

පිටත සහ ඇතුළත තිබෙන ලියුම්කවර වල මුහුණත පහත තොරතුරු සඳහන් කළ යුතුය.
**ආරක්ෂක සේවාව - 2022/2023**
**ආරප/ගි11/2022/12**

ලංසු භාරගැනීම **2022/10/25** දින පෙ.ව.10.00ට අවසන් කරනු ලැබේ.

ලංසු ඉදිරිපත් කළ යුතු ලිපිනය
**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**නො.31, ඉසුරු මාවත,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

ලංසු භාරගැනීම අවසන් කරනු ලබන
දිනය - **2022/10/25**
වේලාව - **පෙ.ව.10.00ට**

ලංසු විවෘත කිරීම සිදුකරනු ලබන ස්ථානය
ලිපිනය - **ප්‍රධාන ගණකාධිකාරී,**
**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,**
**නො.31, ඉසුරු මාවත,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

ලංසු විවෘත කරනු ලබන,
දිනය - **2022/10/25**
වේලාව - **පෙ.ව.10.00ට**

**(ඉ) ලංසු ඇගයීම සහ සැසඳීම**

**1.** __ලංසු ඇගයීමේ නිර්ණායකයන්__

I. ආරක්ෂක සේවාව සැපයීමට ලංසු ඉදිරිපත් කරනු ලබන ආයතන (Black listed) අසාධු ලේඛනයට ඇතුලත් නොවූ ආයතනයක් විය යුතුය.
II. ලංසු ඉදිරිපත් කරනු ලබන ආයතනය ආරක්ෂක සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.
III. ලංසු ඉදිරිපත් කරන දිනට ආරක්ෂක සේවයේ යෙදීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් වලංගු බලපත්‍රයක් ලබාගෙන තිබීම.
IV. ලංසු පිරිවැය රු.5,000,000.00ට වැඩි නම් පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතට අනුව ලබාගත් ලියාපදිංචි සහතිකය පොදු කොන්ත්‍රාත් පනතේ 3 ආකෘති පත්‍රය (පො.කො.ප. 3 ආකෘති පත්‍රය - Form PCA 3)
V. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවන් හා පොලිසියේ සේවාවෙන් **නිත්‍යානුකූල නොවන පරිදි** සේවය හැර ගිය පුද්ගලයින් සේවයේ යොදවා නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ලංසුකරු විසින් ඉදිරිපත් කල යුතුය.
VI. ලංසුකරුගේ ප්‍රකාශය නිවැරදිව සහ සම්පූර්ණ පුරවා තිබිය යුතුය.
VII. ලංසුකරුගේ ප්‍රකාශයේ අත්සන සහතික කිරීම.

ආයතනය වෙනුවෙන් ලංසු ප්‍රකාශය අත්සන් කිරීමට තමන් වෙත බලය පවරන ලද ආදර්ශ අත්සන සහිත ලියවිල්ලේ සහතික කල පිටපතක් ඉදිරිපත් කල යුතුය.

(i) ආයතනය සමාගමක් නම් බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය හෝ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවකින් (Board Resolution) බලය පවරා ඇත්නම් එම වාර්තාවේ පිටපතක් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සහතික කර ඉදිරිපත් කල යුතුය.
(ii) ලංසු ඉදිරිපත් කරන දිනට ආරක්ෂක සේවයේ යෙදීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් වලංගු බලපත්‍රයක් ලබාගෙන තිබීම.
(iii) ආයතනය හවුල් ව්‍යාපාරයක් නම් සියළුම හවුල්කරුවන් විසින් බලය පවරා ඇති ලියවිල්ලේ සහතික කල පිටපතක් ඉදිරිපත් කල යුතුය.
(iv) ආයතනය බද්ධ ව්‍යාපාරයක් නම් බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය හෝ සියළුම සාමාජිකයන් විසින් බලය පවරන ලිපියේ සහතික කල පිටපතක් ඉදිරිපත් කල යුතුය.

VIII. ලංසු සුරක්ෂණ සහතිකය නිවැරදිව සහ සම්පූර්ණව අදාළ ආකෘතියට අනුකූලව ඉදිරිපත් කර තිබිය යුතුය.

IX. ලංසු සුරක්ෂණ ප්‍රකාශය නිවැරදිව සහ සම්පූර්ණව අදාළ ආකෘතියට අනුකූලව ඉදිරිපත් කර තිබිය යුතුය.

X. මෙම කොන්ත්‍රාත්තුවට අදාළ වයස අවුරුදු 18ට වැඩි අවුරුදු 60ට අඩු ආබාධිත නොවන කාර්ය මණ්ඩලයක් සපයා ගැනීමට ඇති හැකියාව සහ සපයාගන්න ආකාරය පිළිබඳව තමා විසින්ම සහතික කරන ලද ලිපියක්.

XI. මාසික පිරිවැය ලේඛනය නිවැරදිව සහ සම්පූර්ණව පුරවා තිබිය යුතුය.

**2. <u>ලංසු සැසඳීමේ නිර්ණායකයන්</u>**

I. මුළු පිරිවැය.

II. ගණිතමය දෝෂ නිවැරදි කරනු ලබන පිරිවැය.

III. වට්ටම් ගලපන ලද පිරිවැය.

IV. ලංසුවේ මුළු පිරිවැය ආයතනයේ වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන තුල පැවතීම.

**3. <u>පශ්චාත් සුදුසුකම්</u>**

I. පසුගිය වර්ෂ දෙක (2019/2020 සහ 2020/2021) කොළඹ බල ප්‍රදේශයේ පිහිටි ආයතන වල ආරක්ෂක සේවා කටයුතු ඉටුකිරීමේදී ලබා ඇති ප්‍රශංසාත්මක ලිපි සහ ලංසුකරුගේ පූර්ව සේවා සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි / ආයතනයේ වාර්තා.

II. ආයතනයේ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශන (2019/2020,2020/2021).

III. පඩි පාලක සභා ආඥා පනත,සේවක අර්ථ සාධක අරමුදල් පනත,ප්‍රසූතිකාගාර පනත,පාරිතෝෂික පනත,අයවැය සහන දීමනා පනත,හා කම්කරු වන්දි ආඥා පනත යටතේ ගෙවිය යුතු දීමනා නිසි පරිදි ගෙවනු ලබන බව සනාථ කරන ලේඛන.

IV. සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල සඳහා කොපමණ සේවක සංඛ්‍යාවකට කොපමණ මුදලක් ගෙවා ඇත් ද යන බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/සේවක භාරකාර අරමුදලෙන් 2020/2021 වර්ෂයට අදාළ (පසුගිය මාස 12ක) ගෙවීම් සහතිකයන් හි සහතික කරන ලද පිටපත්.

V. VAT බදු ලියාපදිංචි සහතිකයේ පිටපතක් (VAT බදු වලින් නිදහස් කර තිබේ නම් දේශිය ආදායම් කොමසාරිස් දෙපාර්මේන්තුවෙන් ලබා ගත් ලිපියක්) සමග 2020/2021 තක්සේරු වර්ෂයේ අවසාන මාස 03ක් VAT බදු ගෙවීම් පිළිබඳ ප්‍රේෂණ පත්‍ර පිටපත්.

**4. <u>කොන්ත්‍රාත් කොන්දේසි - පොදු කොන්දේසි</u>**

I. කොන්ත්‍රාත්තුව සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගණන් කොන්ත්‍රාත්තුව ප්‍රදානයෙන් පසුව වෙනස් කිරිමට ඉඩ දෙනු නොලැබේ.

II. ලංසු ප්‍රදානය ලද කොන්ත්‍රාත්කරු, ලංසු පිළිගැනීමේ ලිපිය ඉදිරිපත් කර දින 07ක් ඇතුලත ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් නියම කරනු ලබන මුදලට සමාන මුදලක් හෝ කාර්‍ය සාධන බැඳුම්කරයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද දේශීය වාණිජ බැංකුවකින් හෝ රක්ෂණ ආයතනයකින් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය. කාර්යය සාධන බැඳුම්කරය ආණ්ඩුවේ රස පරීක්ෂක නමට **2023/11/20** දින දක්වා වලංගු වන ලෙස ඉදිරිපත් කල යුතුය. කාර්යය සාධන බැඳුම්කරය ඉදිරිපත් කල යුතු ආකෘතිය මෙයට අමුණා ඇත. නැතහොත් ඒ වෙනුවට අදාල මුදල ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත මුදලින් තැන්පත් කළ හැක.

III. සුදුසුකම් ලබා ඇති ලංසුකරු තෝරා ගෙන ගිවිසුම අත්සන් කළ පසු අනෙකුත් ලංසුකරුවන්ගේ ලංසු බැඳුම්කර නිදහස් කරනු ලැබේ.

IV. සාර්ථක ලංසුකරුට ලිඛිතව දැනුම් දුන් දින සිට දින 07ක් ඇතුලත එයට සාර්ථක ප්‍රතිචාර නොදක්වන ලද්දේ නම් ඊළඟ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ලබා දීම පිළිබඳව සළකා බැලීමට ප්‍රසම්පාදන කමිටුවට බලය ඇත. ලංසු ප්‍රදානය කිරීමෙන් පසුව සාධාරණ හේතු නොමැතිව එය භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලංසුකරුවන් අසාධු ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත.

V. ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගත් ලංසුකරු ආණ්ඩුවේ රස පරීක්ෂක සමඟ වාර්ෂික කොන්ත්‍රාත්තුව නිසි අයුරින් පවත්වා ගෙන යන බවට ගිවිසුමකට බැඳිය යුතුය. ( ගිවිසුම් පත්‍රය මෙයට අමුණා ඇත.)

VI. සාර්ථක ලංසුකරු ගිවිසුම මඟින් සැපයිමට එකඟ වූ සේවා නොඅඩුව සහ පරිපූර්ණව සැපයිය

යුතුය.

VII. පහත කොන්දේසි ඉටු කරන බවට වග බලා ගැනීමට කොන්ත්‍රාත්කරු දැඩි ලෙස බැඳී සිටී.

(i) ආරක්ෂක සේවාවට අයත් නොවන පුද්ගලයින් ආයතනය තුළ අනවශ්‍ය ලෙස රඳවා නොගැනිමට.

(ii) පැමිණීමේ ලේඛනය නියමිත ලෙස සේවකයින් ලවා අත්සන් කරවීමට.

(iii) සේවකයින් ව්‍යාජ අත්සන යෙදිමෙන් වැළැක්වීම.

(iv) **කොන්ත්‍රාත්තුව මගින් නියම කරන ලද ආරක්ෂක සේවක සංඛ්‍යාව, නියමිත පරිදි සේවයේ යෙදවීම හා එම සේවකයින් වයස:18 ට අඩු නොවන හා අවු:60 ට වැඩි නොවන සහ ආබාධිත පුද්ගලයින් නොවන බවට වග බලා ගැනිම.**

(v) ආරක්ෂක සේවා සැපයිමේ ආයතනය විසින් ආයතනයේ දේපළ හෝ කාර්යාල ඉඩකඩ අනිසි ලෙස පරිහරණය නොකිරිම.

(vi) ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ භූමි භාගය හා එහි පිහිටි සියලුම චංචල නිශ්චල දේපළ සහ වත්කම්වලට හානියක් නොවන ආකාරයෙන් කටයුතු කිරිම.

(vii) ආරක්ෂක සේවකයින් ආයතනයේ කාර්ය මණ්ඩලය හා මහජනතාව සමඟ අර්බුද හෝ ගැටුම් ඇති කර නොගැනීමට වගබලා ගැනීම.

(viii) ආරක්ෂක සේවකයින් කාර්යාල පරිශ්‍රය තුළ දී දෙපාර්තමේන්තු නිළධාරින් හෝ සේවකයින් සමඟ සම්බන්ධතා පවත්වා නොගැනීමට සහ නීත්‍යානුකූල නොවන කටයුතුවල නොයෙදෙන බවට වගබලා ගැනිම.

(ix) එක් ආරක්ෂක නිළධාරියෙකු විවේකයක් නොලැබෙන පරිදි දිගින් දිගටම දිවා සහ රාත්‍රී මුරවල යෙදවීමෙන් වැලකී සිටිය යුතුය.

VIII. ආරක්ෂක සේවාවට අදාළ සියලුම කාර්ය මණ්ඩලය ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ මහජනයාට ආචාරශීලී විය යුතු අතර, මනා විනයකින් යුක්ත විය යුතුය.

IX. ඉහත සේවා සැපයීම් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොයෙදවීම පිළිබඳව හෝ සේවයේ අසතුටුදායක බව පිළිබඳව හෝ වෙනත් පැමිණිල්ලක් පිළිබඳව විභාග කිරිමට ඇති බලය ආණ්ඩුවේ රස පරීක්ෂක සතුවේ.

X. ආරක්ෂක සේවාවට යොදාගනු ලබන සේවකයින් අවම වශයෙන් මාස 06 ක කාලයක්වත් අඛණ්ඩව සේවයේ යෙදවීමට කොන්ත්‍රාත්කරු කටයුතු කළ යුතු අතර, යම් හෙයකින් වෙනස් වීමක් සිදුවුවහොත් කොන්ත්‍රාත්කරු විසින් නොපමාව ඒ බව ආණ්ඩුවේ රස පරීක්ෂකට දැන්විය යුතුය.

XI. (i) ආරක්ෂක කාර්යය සඳහා යොදා ගන්නා සියලුම සේවකයින් කම්කරු දෙපාර්මේන්තුවේ සියලුම නීතිරිතිවලට අනුකූලව සේවයේ යෙදවිය යුතු අතර,ඔවුන්ට පඩි පාලක සභාවේ අනුමත පරිදි වැටුප් හා දීමනා කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුය.එයට අමතරව සේවක අර්ථ සාධක අරමුදල,සේවක භාරකාර අරමුදල සහ වෙනත් කම්කරු නිති යටතේ අදාළ පරිදි ගෙවීම් කළ යුතුය.මෙහි වගකිම අදාළ කොන්ත්‍රාත්කරු දැරිය යුතු වේ. ආණ්ඩුවේ රස පරීක්ෂක හෝ ඔහු විසින් බලය පවරන ලද අන් අයෙකු මේ සඳහා වගකිම දරනු නොලැබේ. (ලංසුවේ දැක්වෙන ඇමුණුම II හි පිරිවැය ඉහත සියලුම ගෙවීම් ඇතුලත් පිරිවැය සේ සැලකේ.)

(ii)තව ද, තමාගේ කවර හෝ සේවකයෙකු විසින් කම්කරු වන්දි ආඥා පනත යටතේ හෝ එහි සම්බන්ධ ව්‍යවස්ථාපිත සංශෝධන ,නොහොත් වෙනස් කිරිම් යටතේ හෝ කරනු ලබන ඕනෑම වන්දි ඉල්ලීමක් සම්බන්ධයෙන් ආරක්ෂක සේවා කොන්ත්‍රාත්කරු වගකිව යුතු අතර,ඒ සම්බන්ධ කිසිම වගකිමකට ආණ්ඩුවේ රස පරික්ෂක බැඳී නොසිටී.

XII. ආරක්ෂක සේවා කොන්ත්‍රාත් කරු වෙත භාර දිය යුතු සියලුම දැන්වීම් එවීම පිණිස ආරක්ෂක සේවය නමින් තෝරාගන්නා ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවුවහොත් ඒවා ඔහුට විධිමත් පරිදි බාර දුන්නා සේ සලකනු ලැබේ. ආරක්ෂක සේවය තම ලිපිනය වෙනස් කළහොත් ඒ බැව් වහාම ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත යැවිය යුතුය. (කොන්ත්‍රාත් කාල සීමාව තුල කොන්ත්‍රාත් ආයතනයේ නම වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.)

XIII. ආරක්ෂක සේවය සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වූ විට ආරක්ෂක සේවා ආයතනය විසින් ඒ බව ලිඛිතව හෝ වාචිකව ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත හෝ බලය පවරා ඇති නිලධාරියෙකුට දැන්විය යුතුය.

XIV. මේ කොන්ත්‍රාත්තුව යටතේ තමාගෙන් ඉටු විය යුතු සේවය ඉෂ්ඨ කිරීමට ආරක්ෂක සේවා කොන්ත්‍රාත් කරුට මොනයම් හේතුවක් නිසා හෝ නොහැකි වුවහොත්, එහෙයින් වෙනත්

| | |
|---|---|
| | ආයතනයකින් එම කරුණට අදාලව රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට දරන්නට සිදුවූ යම් අතිරේක වියදමක් වේ නම් එම වියදම ද, නියම කරන ලද දඩ මුදලක් ද ආරක්ෂක සේවා ආයතනයෙන් අය කර ගැනීමට ආණ්ඩුවේ රස පරීක්ෂකට බලය ඇත. |
| XV. | ආරක්ෂක සේවා ලාභී ආයතනයට අයත් භූමි භාගය තුල එම සේවාව පවත්වා ගෙන යන කොන්ත්‍රාත්කරුට තමාගේ බඩු බාහිරාදිය ගබඩා කර ලබා ගැනීමට යම් කිසි ස්ථානයක් නැතහොත් කාමරයක් සපයනු ලැබේ. ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් සපයා ඇති ගෘහ භාණ්ඩ සහ අනෙකුත් දේපලයන්හි භුක්තිය මේ කොන්ත්‍රාත්තුව අවසන් වූ පසු කිසිම ආරවුලක් නැතිව ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත භාර දිය යුතුය. මාසයකට කලින් දැන්වීමක් කොට ඕනෑම අවස්ථාවක ආරක්ෂක සේවාවේ කොන්ත්‍රාත් කරුට එබඳු ස්ථානයකින් ඉවත් වන ලෙස නියම කිරීමට ආණ්ඩුවේ රස පරීක්ෂකට බලය ඇත. |
| XVI. | තෝරාගත් ලංසුකරුගේ සේවා ඉටු කිරීම අසතුටුදායක බව ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාට පෙනී ගියහොත් සහ ඔහු විසින් කොන්ත්රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩකර ඇත්නම් හෝ ඔහුගේ කාර්ය සාධන බැඳුම්කරයේ හිමිකම අහිමි කිරීමටත්, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමටත් ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාට බලය ඇත. |

**5. <u>වැඩ කොන්දේසි</u>**

I. ආරක්ෂක සේවා ආයතනය විසින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවයේ නියුක්ත සියලුම නිලධාරීන් දිනපතා සේවයට පැමිණීම හා පිටවීම අත්සන් කිරීමට ලේඛනයක් ස්ථානභාර නිළධාරී පවත්වාගෙන යා යුතු අතර, එය දිනපතා ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් බලය පවරනු ලබන නිළධාරියාගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතුය. තව ද මාසය තුළ සේවය කරන ලද සේවකයින්ගේ මුළු සේවා දින ගණන ඇතුළත් වන පරිදි ලේඛනයක් (චෙක්රෝල) ස්ථානභාර නිළධාරී විසින් පවත්වා ගෙන යා යුතුය. මාසික බිල්පත් ඉදිරිපත් කිරීමේ දී එම විස්තර ඇතුළත් වාර්තාවක් ද බිල්පතට අමුණා එවිය යුතුය.

**6. <u>කාර්යමණ්ඩල සහ ගෙවීම් කොන්දේසි</u>**

I. ආරක්ෂක සේවයේ නිළධාරීන් නියමිත නිල ඇඳුමකින් (නිල හැඳුනුම්පත සහ ආයතනයේ නම මුද්‍රණය කරන ලද සුදුසු ඇඳුමක්) සැරසී සිටිය යුතුය.ආරක්ෂක සේවාව සඳහා යෙදවනු ලබන එක් එක් සේවකයාගේ ඡායා රූපය,නම හා අත්සන ඇතුලත් ප්ලාස්ටික් ආවරණයකින් සැදුම්ලත් හැඳුනුම්පතක් පැහැදිලිව පෙනෙන සේ නිළ ඇඳුමේ උඩුකය කොටසේ පැළඳීම සඳහා සියලුම සේවකයන්ට ලබා දීමට ආරක්ෂක සේවා කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කළ යුතු වේ.ආරක්ෂක සේවාවේ යොදවන අයගේ නම් සහ ලිපිනයන් කාර්යාලය වෙත කලින් භාර දිය යුතුය.

II. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින් ඉල්ලා සිටියහොත් ආරක්ෂක සේවයේ නියතු නිලධාරීන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම සේවා සහතිකය හෝ පොලීසියෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කිරීමට ආරක්ෂක සේවා සපයන ආයතනය සූදානමින් සිටිය යුතු අතර ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම පහත සඳහන් ලියවිලි ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතුය.

(i) සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
(ii) සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්.
(iii)සහතික කරන ලද පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක්
(iv)නිලධාරීන්ගේ ස්ථිර ලිපිනයන් සහ දුරකථන අංක

III. සේවයේ යොදවනු ලබන ආරක්ෂක සේවා නිලධාරීන්/ස්ථාන භාර නිලධාරින් සඳහා අවශ්‍ය නිල ඇඳුම්,වැහි කබා,සපත්තු,විදුලි පන්දම්,උපකරණ,ලිපි ද්‍රව්‍ය හා වෙනත් අවශ්‍යතා ආරක්ෂක නියෝජිත ආයතනය විසින් සපයා දිය යුතුය.(ලංසුවේ ඇතුලත් පිරිවැයට ඉහත සියලුම පිරිවැයන් ද ඇතුළත් සේ සැලකේ)

IV. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලවල සාමාජිකයින්ගේ සමීප ඥාතින් මෙම කොන්ත්‍රාත්තුවට අදාල දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවාව සඳහා නොයෙදවිය යුතු අතර,සේවය කරන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල නිලධාරින්ගේ ඉල්ලීම් අනුව සේවකයින් බඳවා ගැනීම නොකළ යුතුය.පෙර නොදැනුවත්ව හෝ බඳවා ගත් එවැනි පුද්ගලයෙක් වේ නම්,එසේ දැනගත් වහාම එම පුද්ගලයා සේවයෙන් ඉවත් කළ යුතුය. ආරක්ෂක සේවයේ යොදවා ඇති ඕනෑම අයෙකු තම දෙපාර්තමේන්තුවට නුසුදුසු බව තීරණය කිරීමට ආණ්ඩුවේ රස පරීක්ෂකට බලය ඇත.

| | |
|---|---|
| V. | අඩුවෙන් සපයනු ලබන සේවක සංඛ්‍යාවන් වෙනුවෙන් පහත සඳහන් පරිදි දඩ මුදල් පනවනු ලැබේ.<br>(i) නියමිත සේවක සංඛ්‍යාවට අඩුවෙන් සේවයේ යෙදවූ දිනයක් සඳහා රු.1000.00 ක මුදලක් සහ එක් එක් සේවකයාගේ දෛනික වැටුපට සමාන මුදලක් දඩ මුදලක් ලෙස අඩු කරනු ලැබේ. |
| VI. | සෑම මසකම 10 දිනට පෙර, ඊට කලින් මාසයට අදාළ බිල්පත් සමඟ මාසික පැමිණීමේ වාර්තා (චෙක් රෝල්) බලයලත් නිලධාරියෙකුගේ සහතිකය සමඟ ගෙවීම් බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වීම.(මෙකී දිනට පසුව ඉදිරිපත් කෙරෙන බිල්පත් ගෙවීම් සම්බන්ධයෙන් ඇති වන ප්‍රමාදයන් සම්බන්ධයෙන් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වගකීමට බැඳී නොසිටී. |

ඉහත 4,5 සහ 6 කොන්දේසි වලින් ආවරණය නොවුන යම් කරුණක් වේ නම් ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ආණ්ඩුවේ රස පරීක්ෂක සතුය.

| ලේඛන/ලිපි | ඉදිරිපත් කර තිබේද ඔව්/නැත |
|---|---|
| 1. ව්‍යාපාර ලියාපදිංචි සහතිකය | |
| 2. ලංසු ඉදිරිපත් කරන දිනට ආරක්ෂක සේවයේ යෙදීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් වලංගු බලපත්‍රයක් ලබාගෙන තිබීම. | |
| 3. පොදු කොන්ත්‍රාත් පනතේ 3 ආකෘති පත්‍රය (පො.කො.ප. 3 ආකෘති පත්‍රය - Form PCA 3) | |
| 4. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවන් හා පොලිසියේ සේවාවෙන් නිත්‍යානුකූල නොවන පරිදි සේවය හැර ගිය පුද්ගලයින් සේවයේ යොදවා නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ලංසුකරු විසින් ඉදිරිපත් කල යුතුය. | |
| 5. ලංසුකරුගේ ප්‍රකාශය | |
| 6. ලංසුකරුගේ ප්‍රකාශයේ අත්සන සහතික කිරීම [ලංසු ඇගයීම සහ සැසඳීම පරිච්ඡේදයේ අංක 5 යටතේ ඉල්ලා ඇති ලියවිල්ල] | |
| 7. ලංසු සුරක්ෂණ සහතිකය | |
| 8. ලංසු සුරක්ෂණ ප්‍රකාශය | |
| 9. කොන්ත්‍රාත්තුවට අදාළ වයස අවුරුදු 18 වැඩි අවුරුදු 60 අඩු ආබාධිත නොවන කාර්යමණ්ඩලයක් සපයාගැනීමට ඇති හැකියාව සහ සපයාගන්නා ආකාරය පිළිබඳව තමා විසින්ම සහතික කරන ලද ලිපිය | |

ඇමුණුම - II

**ආරක්ෂක සේවාව 2022/2023**

**මාසික පිරිවැය ලේඛනය**

| | විස්තරය | සේවක සංඛ්‍යාව (1) | මාසික වැටුප් පිරිවැය * (2) | වාර්ෂික වැටුප් පිරිවැය ** (3) = (1)+(2) x 12 |
|---|---|---|---|---|
| දිවා සේවා මුරය | | | | |
| (1) | ස්ථාන භාර ආරක්ෂක නිලධාරී | 01 | | |
| (2) | ආරක්ෂක නියාමක | 03 | | |
| (3) | කාන්තා ආරක්ෂක නියාමක | 01 | | |
| රාත්‍රී සේවා මුරය | | | | |
| (4) | ආරක්ෂක නියාමක | 03 | | |
| (5) | මුළු වාර්ෂික වැටුප් පිරිවැය (1– 4 දක්වා එකතුව) | | | |
| (6) | අනෙකුත් වාර්ෂික පොදු කාර්ය පිරිවැය | | | |
| (7) | මුළු වාර්ෂික පිරිවැය (4) + (5) | | | |
| (8) | බදු මුදල (15% VAT) | | | |
| (9) | මුළු වාර්ෂික පිරිවැය (බදු සහිත) (6) + (7) | | | |

....................................................................

ලංසුකරුගේ අත්සන (රබර් මුද්‍රාව තබන්න)

** දිනකට පැය 12ක සේවා මුරයක් අනුව වාර්ෂික වැටුප් පිරිවැය සඳහන් කරන්න.*

*** (සේවක සංඛ්‍යාව X මාසික වැටුප X 12)*

**ඇමුණුම - III**

**රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

**සේවා සැපයිය යුතු ස්ථාන**

| **නිලධාරීන් සංඛ්‍යාව** | **සේවා ස්ථානය** | **දිවා/රාත්‍රී සේවා** |
|---|---|---|
| ස්ථාන භාර නිලධාරී (පිරිමි) | කාර්යාලය | දිවා 01 |
| ආරක්ෂක නිලධාරී (පිරිමි) | කාර්යාලය පිවිසුම<br>කාර්යාල ගොඩනැගිල්ලේ පිවිසුම | දිවා 02 - රාත්‍රී 02<br>දිවා 01 - රාත්‍රී 01 |
| ආරක්ෂක නිලධාරී (කාන්තා) | කාර්යාල ගොඩනැගිල්ලේ පිවිසුම | දිවා 01 |

- අවශ්‍ය වන කාර්ය මණ්ඩලය 08 ක් වේ.
- දිවා සේවා මුරය පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා ක්‍රියාත්මක වන අතර, රාත්‍රී සේවා මුරය ප.ව. 6.00 සිට පසුදා පෙ.ව. 6.00 දක්වා වේ.

# ලංසුකරුගේ ප්‍රකාශය

සභාපති ,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,

31, පැලවත්ත, බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

<u>ආරක්ෂක සේවා සැපයීම 2022/2023</u>

උක්ත ආයතනයෙහි 2022/2023 වසර සඳහා ආරක්ෂක සේවය සැපයීමට වසරකට රු ......................... (ඉලක්කමෙන්) ........................................................................................................................ (අකුරෙන්) (VAT බදු රහිත) රු ......................... (ඉලක්කමෙන්) ......................................................................... (අකුරෙන්) (VAT බදු සහිත) මිල ගණන් (ඇමුණුම I) මේ සමඟ ඉදිරිපත් කරමි. ඔබ විසින් ඉදිරිපත් කර ඇති සියළුම ලංසු කොන්දේසි වලට යටත්ව මිල ගණන් ඉදිරිපත් කරන බවත් රු. .................................. ක් වටිනා ................... දින සිට ........................ දින දක්වා වලංගු .......................................... බැංකුව/ රක්ෂණ ආයතනය විසින් නිකුත් කරන ලද ලංසු බැඳුම්කරය/ පොදු 172 ආකෘතිය (මුල් පිටපත) ද මේ සමඟ ඉදිරිපත් කරමි/ කරමු.

02. අවම මිල තෝරා ගැනීමට ඔබ බැඳී නොමැති බවත්, මාගේ/අප ආයතනයේ ලංසු අයදුම්පත ලංසු ප්‍රදානය සඳහා තෝරා ගතහොත් සියළුම ලංසු කොන්දේසි වලට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව සාර්ථකව ඉටු කිරීමටත් මා/ අප එකඟ බව දන්වා සිටිමි/ සිටිමු

..........................................................

දිනය

ලංසුකරුගේ අත්සන

(මුද්‍රාව)

ලංසුකරුගේ/ ආයතනයේ නම : ..................................................................................................

ලිපිනය : .........................................................................................................................

දුරකථන අංක : ................................................ ෆැක්ස් අංක : ...........................................................

ඊ මේල් : .............................................................